# වගාව රකින කාලගුණ විමසුමක්

අප නිදහස ලබාගත් ද සිටම ආහාර ද්‍රව්‍ය අතින් ස්වයංපෝෂිත වීමට දිරි දරමු. මෙරට කෘෂිකාර්මික ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ මූලික අරමුණු වූයේ ආහාර ද්‍රව්‍ය අතින් ස්වයංපෝෂිත භාවය ලබා ගැනීමයි. නමුත් මෙම අරමුණු කෙරෙහි ළඟාවීමට ප්‍රධාන බාධකය ලෙසින් කාලගුණයෙහි වෙනස්වීම සැමද ඉදිරියෙන් සිටියේය.

කාලගුණයෙහි පවතින අස්ථිර ස්වභාවය නිසා වගාවන් පාළු වේ. දැඩි නියඟය මෙන්ම අධික වර්ෂාවද ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අරමුණු ගිල දමනු ලබයි. කාලගුණය තවමත් අපට පාලනය කළ නොහැකි බලවේගයක්ව ඇත්තේය. අප


පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරි

**බණ්ඩාර රත්නායක**

**විසිනි**


කවුරුත් ගොවිතැන් විනාශයේදී කාලගුණයට දෙස් පැවරීමට නිරන්තරයෙන්ම පෙළඹෙන්නේ එම නිසා ය. නමුත් මෙයින් ලබාගත හැකි ප්‍රයෝජනයක් නොමැත. කාලගුණයෙහි බලපෑමෙන් බෝග වලට වන හානිය අඩු කිරීම සඳහා කටයුතු කලයුතු වන කාලය එළඹ ඇත්තේය. මේ සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන කෙරෙහි ඒ ඒ කාලයේ කාලගුණ තත්ත්වයන් කෙසේ බලපානු ලබයිද යන්න ගැන කල්තියා පුරෝකථනය කළයුතු වේ. අපේ කෘෂි කාර්මික සංවර්ධනය සඳහා මෙම පුරෝකථනය කිරීම අත්‍යාවශ්‍ය බව ඒ පිළිබඳ විශේෂඥයින් විසින් දැනටමත් පෙන්වා දී ඇත.

මෙරට වාර්ෂික සහල් නිෂ්පාදනයෙන් 65%ක් පමණ (මෙට්‍රික් ටොන් දශලක්ෂ 1.6) ලබා දෙනුයේ මහ කන්නයෙන්ය. (සැප්තැම්බර් සිට මාර්තු දක්වා කාලය) මෙම අස්වැන්නෙන් 7%ක් පමණ ස්වභාවික හේතූන් සහ භෞතිකමය හේතූන්ගේ බලපෑමෙන් විනාශ වී යනු ඇත. ඒ සඳහා වැස්ස, ගංවතුර, නියඟය, ආර්ද්‍රතාවය වැනි ස්වභාවික හේතූන්ද, කෘමීන්, කුරුල්ලන්, මීයන්, හාවුන් වැනි සතුන්ගෙන් සිදුවන විනාශයද බලපානු ඇත. නමුත් මෙරට සිදුවන බෝග විනාශයෙන් 80% ක්ම සිදුවන්නේ නියඟය සහ ගංවතුර හේතුවෙන් බව සමීක්ෂණ වාර්තා වලින් පැහැදිලි වේ. වෙනත් අයුරකින් කියන්නේ නම් ස්වභාවික හේතූන් නිසාය. මෙම හේතුවෙන් 1983/84 මහ කන්නයේදී මෙරට වී වගා කල මුළු බිම් ප්‍රමාණයෙන් 16%ක්ද 84/85 මහ කන්නයේදී 1.7%ක්ද විනාශ වී ගියේය. නැවතත් මේ විනාශය අධික වූයේ පසුගිය මාසවල ඇතිවූ ගංවතුර උවදුර නිසාය. එම නිසා 1985/86 මහ කන්නයේදී අපේ වී වගාවෙන් 20%ක් සහමුලින්ම විනාශ වී ගියේය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛණ වලට අනුව මෙම වගා විනාශය බෙහෙවින්ම දැකිය හැකි වූයේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ය. මඩකලපුව දිස්ත්‍රික්කයේ වී වගාකළ මුළු බිම් ප්‍රමාණයෙන් 41%ක් (හෙක්ටයාර් 14,163) ගං වතුරට ගොදුරුවූ බව සංඛ්‍යා ලේඛණ මගින් පැහැදිළි ය. අම්පාර දිස්ත්‍රික්ක යෙහි වී වගාවෙන් විනාශ වූයේ 23% කි. නුවර-එළිය දිස්ත්‍රික්කයේ වගාවන්ගෙන් 16%ක් විනාශ විය. මේ හැරුණු විට පොළොන්නරුව, බදුල්ල සහ මාතලේ යන දිස්ත්‍රික්ක වලද වගා බිම් වලින් සැළකිය යුතු ප්‍රමාණයක් ගංවතුර තර්ජනයේ බලපෑමෙන් විනාශ විය.

කාලගුණය මෙරට බෝග වගාව කෙරෙහි දක්වනු ලබන බලපෑම පොදු තත්ත්වයක් බවට අද පත්ව ඇත්තේය. 1956, 1957, 1961, 1964, 1966, 1967, 1968, 1974, 1975, 1976, 1977, 1978, 1979, 1981, 1983, 1984, 1986 යන වර්ෂ වලදී මෙරට බෝග වගාවන් කෙරෙහි කාලගුණ තත්ත්වය අහිතකර බලපෑම් ඇති කළේය. එම නිසා අද මෙය සාමාන්‍ය තත්ත්වයක් බවට පත්වීම පුදුමයක් නොවේ. කාල

ගුණයේ රුදුරු හස්තයෙන් බැට කන අපේ ගොවියා තවමත් එම තත්ත්වයේම රඳනවාද යන්න, අවධානය යොමු කළයුතු ගැටළුවක් බවට පත්ව ඇත.

මෙරට සුළු ගොවියාට තමාගේ වගාව විනාශවීම දරාගත නොහැකි වෙයි. එම නිසා බෝග වර්ග තෝරා ගැනීමේදී එම වගාවේ ඇති අස්ථිරතාවය හා අවධානම ගැන දැඩි සැළකිල්ලක් යොමු කිරීමට ඔවුනට සිදු වේ. මෙම නිසා ගංවතුරක් හෝ නියඟයක් ගැන බලාපොරොත්තුවක් ඇත්නම් ඔවුන් එම වගාව කෙරෙහි විශ්වාසයක් නොතබනු ඇත. අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්කවල පසුගිය කාලයේ ඇතිවූ ගංවතුරින් තම වගාවන් ආරක්ෂා කරගත නොහැකිව සුසුම් හෙලුවෝ ගොවීහුය. එසේම දැනට වර්ෂ තුනකට ඉහතදී මෙම ප්‍රදේශවලම මහ කන්නය සඳහා වගා කටයුතු ඇත හිටියේ ජලය නොමැති කම නිසාය. එද ගොවීන්ගෙන් 50%ට පමණ වගා කටයුතු කල නොහැකි විය. ගොයම් තවාන් වලම වේලී ගියේය. නමුත් මේ බව ගොවීන් කලින් දන්නේ නම් මෙවැනි ඉරණමකට ගොදුරු නොවී සිටීමට හැකිය. අඩුම වශයෙන් වගා කන්න මාරු කිරීමට හෝ ඔවුන්ට හැකිවනු ඇත. අද ගං වතුර නිසාත් හෙට නියඟය නිසාත් තම ජීවනෝපාය වන ගොවිතැන විනාශ වී යෑම දෙස බලාසිටින ගොවියාට කාලගුණ තොරතුරු කලින් දැනගැනීමට ඇත්නම් එය විශාල ප්‍රයෝජනයක් වනු ඇත.

පසුගිය ජල ගැල්ම නිසා අපට අහිමිවූයේ වී වගාව පමණක් නොවේ. බොහෝ ප්‍රදේශ වල බඩ ඉරිඟු, කව්පි, මුංඇට වැනි වගාවන් ද ජලයෙන් විනාශ වී ගියේය. මහ කන්නයේ අස්වැන්න විනාශ වී යෑම නිසා මාර්තු, අප්‍රේල්, මැයි යන මාස වලදී මේවායෙහි මිළ ඉහල මට්ටමක පවතිනු ඇත. මේ හැරුණ විට ජල ගැලීම් හා නායයෑම් මගින් උඩරට එළවළු වගාවට බෙහෙවින් අහිතකර බලපෑම් ඇති විය. එහි ප්‍රතිඵල පෙබරවාරි මුල් කාලයේදීම පෙනෙන්නට විය. කොළඹ තොග වෙළඳපොලට ලැබෙන එළවළු තොග ප්‍රමාණය දිනෙන් දින අඩුවුන අතර, මිළ වේගයෙන් ඉහළ නැංගේය. තවමත් අපේ එළවළු වර්ග සඳහා දැකිය හැකි වන්නේ ඉහළ මිළ ගණන් ය. මෙවැනි අතිරේක ආහාර ද්‍රව්‍ය හැරුණ විට, පසුගිය ගංවතුර නිසා අම්පාර හා මඩකලපුව යන දිස්ත්‍රික්ක දෙකින් පමණක් වී බුසල් දශලක්ෂ 3.5 ක් අපේ ජාතික නිෂ්පාදනයට අහිමි විය.

මෙම තත්ත්වය අද ඊයේ ඇති වූවක් නොවේ. ඈත අතීතයේදී මිනිසා කෘෂිකාර්මික දිවි පෙවෙතට මුල පිරූ ද සිට ඔහුට කාලගුණය බාධා කොට ඇත. මේ ගැන මුලින්ම කරුණු සොයා බැලීමට පෙළඹුනේ ඇමරිකානු ජාතික සාගරික හා වායුගෝලීය කටයුතු සම්බන්ධ පාලන තන්ත්‍රය මගිනි. මොවුන්ගේ පරීක්ෂණ නිසා ඉදිරි කාලයේ කාලගුණ තත්ත්වය ගැන පුරෝකථනය කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීමට හැකිවිය. දකුණු හා ගිණිකොන දිග ආසියානු රටවල් සඳහා කාලගුණය ගැන අනාවැකි කීමටත් ඒ ආශ්‍රයෙන් ගොවීන්ට තම වගා කටයුතු සැළසුම් කර ගැනීම ගැන උපදෙස් දීමටත් මෙ ආයතනයට හැකිවිය. මෙහි පූර්ණ අනුග්‍රහය හා උපදෙස් යටතේ මෙරටේ ද මෙවැනි වැඩ පිළිවෙලක් දැන් ක්‍රියාත්මකව පවතී. ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහයෝගයෙන් මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක වී ඇත.

මසකට වරක් එම තොරතුරු ඇතුලත් වාර්තාවක් ඔවුන් විසින් සම්පාදනය කරනු ලැබේ. කාලගුණ විද්‍යා තොරතුරු, වගාබිම් පිළිබඳව තොරතුරු, හා ඒ ඒ දිස්ත්‍රික්ක පිළිබඳව වෙනත් ආර්ථික තොරතුරු වාරිමාර්ග ජල පහසුකම් පිළිබඳ තොරතුරු ද ආශ්‍රයෙන් මෙම විග්‍රහයන් ඉදිරිපත් කිරීමට ප්‍රතිපත්ති සම්පාදක යන්ට හැකිවී තිබේ. මෙය මගින් ගොවීන්ට තමාගේ වගා කටයුතු පිළිබඳ අවබෝධයක් ලබාදීමට මෙන්ම නිවැරදි කාලයක වගා කිරීමට පෙළඹවීම මගින් තම වගාව ගැන ඔවුන් සතු අවදනම අඩු කිරීමද කළ හැකිය.

මෙම ක්‍රමය මගින් ගංවතුරක් සහ නියඟයක් අතර ඇති පරතරය හඳුනා ගැනීමට හැකිය. රටේ ආර්ථිකය පිළිබඳව ඉමහත් බලපෑමක් ඇති කිරීමට නියඟයට මෙන්ම, ජල ගැල්මටද හැකිය. මේ කාලය හඳුනා ගැනීම අපේ කෘෂි ප්‍රතිපත්ති සම්පාදකයන්ට තම අරමුණු කරා ලඟා වීමට පහසු කරවනු ඇත. එසේම ආහාර ප්‍රතිපත්ති සම්පාදකයින්ටද මෙය වැදගත් වනුයේ ආරක්ෂිත තොග රැස්කර ගැනීමට හා සැපයුම පාලනය කර ගැනීමට ප්‍රයෝජනවත් වන නිසාය.

මෙම ක්‍රමය ප්‍රධාන විශ්ලේෂණ ක්‍රම දෙකක් මත පදනම් වී ඇත. එනම් සතිපතා එකතු කරනු ලබන සංඛ්‍යා තොරතුරු මත පදනම් වූ ප්‍රාදේශීය වර්ෂාපතන

(34 පිටුව බලන්න)

## 30 වන පිටුවෙන් . . .

දර්ශක විශ්ලේෂණය හා කාලගුණික හා දේශගුණික තොරතුරු, වගා දින දර්ශණය, වගාවන් පිළිබඳ වෙනත් තොරතුරු සහ සුළිසුලං වැනි හදිසි විපත් ගැන තොරතුරු ද විශ්ලේෂණයෙන් සකස් කරනු ලබන ආහාර තොග පිළිබඳ විශ්ලේෂණයයි.

ශ්‍රී ලංකාවේ මෙම ක්‍රමය දියුණු කිරීමට ඇති ප්‍රධාන බාධකය වී ඇත්තේ ඒ පිළිබඳව ලබාගත හැකි තොරතුරු ඉතා අඩුවීමයි. නමුත් මෙවැනි ක්‍රමයකින් ලබාගත හැකි ප්‍රයෝජනය අතිමහත් ය. ශ්‍රී ලංකාව ආශ්‍රිත ආසියානු කලාපීය අනිකුත් රටවල් සමග සම්බන්ධතා ඇතිකර ගැනීම මගින් මෙම ක්‍රමය තවදුරටත් වර්ධනය කර ගැනීමට හැකිය. මෙහි අවසාන පියවර වශයෙන් අපේ ගොවීන්ට වගා කටයුතු ගැන උපදෙස් දීමට, ජල හැලීම්, නියඟ ගැන කලින් දැනුම් දීමට පුළුවන් වේ. ඉන් ලැබෙන ප්‍රතිඵලය මුළු මහත් ජනතාවටම වන අතර විශේෂ යෙන්ම ගොවියාට තම ගොවිතැන කෙරෙහි අවධානයක් දැරීමට සිදු නොවනු ඇත.